# සීමාසහිත කුලියාපිටිය කෝට්ඨාසයේ විවිධ සේවා සමුපකාර සමිතිය - කුලියාපිටිය

# තනතුරු පුරප්පාඩු

සීමාසහිත කුලියාපිටිය කෝට්ඨාසයේ විවිධ සේවා සමුපකාර සමිතියේ පුරප්පාඩුව පවතින පහත තනතුර සඳහා සමිති බල ප්‍රදේශයේ පදිංචි බාහිර හා අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුරු නාමය - නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බැංකු) III ශ්‍රේණිය**

1. **වැටුප් පරිමාණය** - 3/2020 MEL = රු. 35,125/- = 750 x 10 - 900 x 11 - 1,000 x 05 = රු. 57,525/- (A - ශ්‍රේණිය)
2. **වයස් සීමාව** - අවුරුදු 18 ත් 45 ත් අතර / අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව බල නොපැවැත්වේ.

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්**
**(බාහිර බඳවාගැනීම් සඳහා)**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජවේදී හෝ ව්‍යාපාර කළමනාකරණය හෝ ආර්ථික විද්‍යාව විෂයය සහිතව හෝ උපාධියක් ලබා තිබීම සමග පිළිගත් ආයතනයක විධායක මට්ටමේ තනතුරක වසර 02 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම

හෝ

ආ) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) සමත් වීම හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA) ආවසාන සහතිකය (Executive Level) ලබා තිබීම හෝ සමග බැංකු ක්ෂේත්‍රයේ අධීක්ෂණ මට්ටමේ තනතුරක වසර 03 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම

හෝ

ඇ) ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ බැංකු හා මූල්‍ය ඩිප්ලෝමාව සමත් වීම සමග බැංකු ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු අධීක්ෂණ මට්ටමේ තනතුරක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්**
**(අභ්‍යන්තර බඳවා ගැනීම් සඳහා)**

අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් වාණිජවේදී හෝ ව්‍යාපාර කළමනාකරණ හෝ ආර්ථික විද්‍යාව විෂයය සහිතව හෝ උපාධියක් ලබා තිබීම හෝ සමග රැකියා ක්ෂේත්‍රයට අදාළව සමුපකාර ව්‍යාපාරයේ වසරකට නොඅඩු අධීක්ෂණ මට්ටමේ තනතුරක සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම

හෝ

ආ) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA) සමත් වීම හෝ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (CA) ආවසාන සහතිකය (Executive Level) ලබා තිබීම හෝ සමග TSL වැටුප් පරිමාණයේ තනතුරක වසර 02 කට හෝ SL වැටුප් පරිමාණයේ තනතුරක වසර තුනකට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම

හෝ

ඇ) පිළිගත් ආයතනයකින් ලබාගත් වසරකට නොඅඩු අධ්‍යයන කාලයක් සහිත බැංකු කළමනාකරණය පිළිබඳව ඩිප්ලෝමාවක් සමත්වීම හෝ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ බැංකු හා මූල්‍ය ඩිප්ලෝමාව සමත්වීම හෝ සමග TSL වැටුප් පරිමාණයේ තනතුරක වසර 04 කට හෝ SL වැටුප් පරිමාණයේ තනතුරක වසර 08 කට නොඅඩු සතුටුදායක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**වෙනත් දීමනා හා වරප්‍රසාද**

01. කාර්ය මණ්ඩල දිරි දීමනා හා වෙනත් දීමනා හිමි වේ.
02. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් දායක ක්‍රමයට බඳවා ගැනීම.
03. EPF / ETF අරමුදලේ දායකත්වය හිමි වේ.
04. සහන පොලී පදනම මත සේවක ණය ලබා ගැනීමේ හැකියාව.

ඉහත තනතුර සඳහා සමිති බල ප්‍රදේශය තුළ පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් 2022.10.12 දින දක්වා කැඳවනු ලැබේ. ඔබ විසින් පිළියෙල කර ගන්නා ලද අයදුම්පතක් එවිය යුතු අතර, අධ්‍යාපන සහතික ඡායා පිටපත්, උප්පැන්න සහතිකයේ ඡායා පිටපත, ග්‍රාම සේවක සහතිකයේ ඡායා පිටපත මේ සමග අමුණා එවිය යුතු වේ. ඔබගේ අයදුම්පත්‍ර 2022.10.12 දින මධ්‍යාහ්න 12.00 ට පෙර **සභාපති, සීමාසහිත කුලියාපිටිය** කෝට්ඨාසයේ විවිධ සේවා සමුපකාර සමිතිය, කුලියාපිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ ගෙනැවිත් භාර දීම සිදු කළ හැකිය.

**සමුපකාරික සභාපති,**
**ජේ.පී. ප්‍රසාද් නිරෝෂ් තිලන්ත**

**දුරකථන අංක - 037-2281163 / 037-4942452**